ඝාතනයට ලක්ව ඇති බව පැවසෙන අටළුගම 9 හැවිරිදි දැරියගේ මරණය සම්බන්ධයෙන් වාර්තා කර ඇති දිවයින කතුවැකිය (මැයි 30, 2022) සහ අරුණ පුවත් වාර්තාවක් (මැයි 30, 2022) නිරීක්ෂණය කිරීමේදී, එම දෙතැනම එම මරණයට පත් දැරිය සම්බන්ධයෙන් හැඳින්වීමේදී "රූමත්, හුරුබුහුටි" සහ "සුරූපී, සුරතල්" යනාදී වශයෙන් විශේෂණ භාවිතා වී තිබූ බව දක්නට ලැබිණි. ඒ ඔස්සේ, එම කතුවැකියත්, පුවත් වාර්තාවත් භාවාතිෂය ආකාරයකින් ඉදිරිපත් වී තිබිණි.

ඔබ සිතන ආකාරයට,

1) ඝාතනයට ලක්ව ඇති බවට සැක කෙරෙන බාලවයස්කාර දැරියක සම්බන්ධයෙන් මෙවැනි බාහිර ස්වරූපය හුවා දක්වන, භාවාතිෂය වාර්තාකරණයක් කෙතරම් උචිත වන්නේ ද? කෙතරම් මාධ්‍ය ආචාර ධර්මානුකූල වන්නේ ද?

2) එවැනි වාර්තාකරණයන් ඔස්සේ, මෙවැනි සිදුවීම් තවතවත් සිදුවීමට වක්‍රාකාරයෙන් අනුබල ලැබිය හැකි යැයි ඔබ සිතන්නේ ද?

ඔබේ අදහස කුමක්ද?